# සිංහල ළමා ගහනය අඩු වෙද්දී මුස්ලිම් ළමා ගහනය තුන් ගුණයකින් වැඩි වෙලා

ළමා ජනගහනය වර්ධනයේදී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ සහ මුස්ලිම් ජන වර්ගවල වර්ධන ප්‍රතිශතය ඉහළ ගිහින්. නමුත් සිංහල පමණක් 75% සිට 71% දක්වා අඩුවෙලා. මේ අතර මුස්ලිම් ළමා ජනගහනය තුන් ගුණයකින් වැඩි වී ඇතැයි පිවිතුරු හෙළ උරුමය නායක පාර්ලිමේන්තු මන්ත්‍රී උදය ගම්මන්පිල පැවසීය.

මුස්ලිම් ජනගහනය 42%ක් බවට ඇතැම් අය විවිධ කට කතා පතුරවනවා. මේ සම්බන්ධව ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඉන්දු බණ්ඩාර මහත්මියගෙන් කළ ඉල්ලීමට අනුව ලබාගත් 2012 වසරේ ජන සංගණනයේ තොරතුරු පදනම් කරගෙන ගම්මන්පිල මහතා මේ බව කියා සිටියේය.

කොළඹ පුස්තකාල හා ප්‍රලේඛන දෙපාර්තමේන්තුවේ ඊයේ (19දා) පෙරවරුවේ පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවකට එක්වෙමින් ඒ මහතා පැවසීය.

**එහිදී උදය ගම්මන්පිල මහතා මෙසේද කීය.**

මුස්ලිම් ළමා ජනගහනය පිළිබඳ සමහරු විවිධ කටකතා පතුරවනවා. සමහරු කියන්නේ මුස්ලිම් ජනගහන ප්‍රතිශතය 42%යි කියලා. නමුත් මේ අය කතා කරන්නේ අදාළ මූලාශ්‍ර පදනම් කරගෙන නොවෙයි. මුස්ලිම් ජනගහනයේ ශීඝ්‍ර වර්ධනයක් තිබෙන බව ඇත්තක්. නමුත් ජන වර්ග අනුව ළමා ජනගහනය වාර්තා කරන්නේ නෑ. 2012 ජන සංගණනයට අනුව ළමා ජනගහනයේ ජනවාර්ගික සංයුතිය සකසා දෙන්න කියලා මම ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඉන්දු බණ්ඩාර මහත්මියගෙන් ඉල්ලා සිටියා. ඒ අනුව මා වෙත ලැබුණු තොරතුරු මෙසේය.

2012 සමස්ත ජනගහනයෙන් 75%ක් සිංහල, 11%ක් ලංකා දෙමළ, 4%ක් ඉන්දියානු දෙමළ, 9%ක් මුස්ලිම්.

2012 වසර වන විට ළමා ජනගහනයෙන් 71%ක් සිංහල, 12%ක් ලංකා දෙමළ, 5%ක් ඉන්දියානු දෙමළ, 12%ක් මුස්ලිම්. සමස්ත ජනගහනයට සාපේක්ෂව ළමා ජනගහනයේදී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ සහ මුස්ලිම් ජන වර්ගවල ප්‍රතිශතය ඉහළ ගිහින්. නමුත් සිංහල පමණක් 75% සිට 71% දක්වා අඩු වෙලා. වැඩිම වර්ධන වේගය මුස්ලිම් ජනගහනයයි. එහි වර්ධන වේගය 9% සිට 12% දක්වා වැඩිවෙලා.

අවුරුදු 5 සිට 9 දක්වා වයස් කාණ්ඩයට සාපේක්ෂව අවුරුදු 0 සිට 4 දක්වා වයස් කාණ්ඩය තුළ සිංහල ජනගහනය වැඩි වී ඇත්තේ 0.5%කින්. නමුත් මුස්ලිම් ජනගහනය 1.4%කින් වැඩිවෙලා. ඒ කියන්නේ මුස්ලිම් ජනගහනය තුන් ගුණයකින් වැඩි වෙලා. දශක ගණනාවක සිට මුස්ලිම් ජනගහනයේ ශීඝ්‍ර වර්ධනයක් තිබෙනවා.

1953දී මුස්ලිම් ජනගහනය 6%යි. 1981 වන විට වසර 28ක් තුළ එය 7%ක මට්ටමට පැමිණියා. නමුත් ගෙවී ගිය වසර 30 තුළ මුස්ලිම් ජනගහන වර්ධනය 9% දක්වා වර්ධනය වෙලා. ඉදිරි වසර 10 තුළ මුස්ලිම් ජනගහනය 12% ඉක්මවා යන බව සිව පෙනෙයි.

පවත් කාරණයක් සඳහන් කළ යුතුයි. මීළඟට බලයට පත්වන ජනාධිපති කිසිම බලයක් නොමැති බවට සමහරු පට්ටපල් බොරු දෙසා බානවා. පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකරත් මේ ගැන කියා තිබුණා. 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එහෙම දෙයක් නෑ, එහෙම කරලා නෑ. වර්තමාන ජනාධිපතිට වඩා අනාගත ජනපතිට බලතල අඩුවෙන්නේ කොහොමද කියා පෙන්වීමට රූපවාහිනී විවාදයකට එන්න කියලා දයාසිරි ජයසේකර මහතාට අභියෝග කර සිටිනවා.

19 වැනි ව්‍යවස්ථා සංශෝධනයට අනුව ඊළඟ ජනාධිපතිට අහිමි කර ඇත්තේ බලතල තුනයි. එක තමයි ස්වාධීනව අමාත්‍යවරු පත් කිරීම, වසර දෙකකට පසු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට තිබූ බලතල, තුන තමයි ජනතාවගේ සෘජු අනුමැතියෙන් තීරණයක් සම්මත කිරීම ඒ බලතල තුනයි.

## මීළඟට එන ජනපතිට කිසිදු බලයක් නෑ කියා සමහරුන් කියන්නේ බොරු



## ඉදිරි වසර 10 තුළ මුස්ලිම් ජනගහනය 12% ඉක්මවා යනවා

අපේ රට 1989 වසරේ සිට අඛණ්ඩව දිළිඳු ජනතාවට මාසිකව ආධාර දුන් රටක්. නමුත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාස 11ක මලිත් මීහිරංග නමැති දරුවකු සත්ත්ව හැඳින්වීම් පෝෂණයේ මියගිහින්. මේ පවුලට සමෘද්ධිය ලැබිලා නෑ. සමෘද්ධිය ලබාගෙනදී ඒ දරුවා මැරෙන්න හැරිය නම් එය මිනීමැරුමක්. ඒ නිසා ඒ පිළිබඳ වහාම සොයාබැලීමට පරීක්ෂණයක් ආරම්භ කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ශිරාන් රණසිංහ**



## දැන් බිය විය යුත්තේ සහරාන්ලාට කිරි පෙවූ රිෂාඩ්-හිස්බුල්ලා